**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

NATIONAL LIBRARY OF SRI LANKA
N L S L

# පුරප්පාඩු

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **තනතුර** : **අධ්‍යක්ෂ (මුදල් හා පාලන) (පුරප්පාඩු 01)**

**සේවා ගණය** : ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1 – 1)

**වැටුප් පරිමාණය** : HM 1 - 1 - 2025 රු:140,640 – 15 x 4,100 - 202,140/= (මාසික)
(ක.සේ.ව.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:105,399/=ක්ද, 2026.01.01 දිනට රු:123,019/=ක්ද සහ 2027.01.01 දින සිට රු:140,640/=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

**වයස** : අවු:35 ට නො අඩු හා අවු:55 ට නො වැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ උපාධියක් (රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර පරිපාලනය/මූල්‍ය/ගිණුම්/කළමනාකරණය පිළිබඳව) පළමු හෝ දෙවන පංතිය (ඉහළ පෙළ) පංති සාමාර්ථ්‍යයක් සහිතව ලබා තිබීම.

   **සහ**

   ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters Degree) ලබා තිබීම/ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතික ලත් සංස්ථාපිත ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ආශ්‍රෙය සාමාජිකත්වය ලබා තිබීම

   **සහ**

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර පහළොව(15)ක පළපුරුද්දක් ලබා තිබීම.

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) හෝ හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතික ලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

   **සහ**

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර පහළොව (15)ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වූ සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකාර (MM 1- 1) සේවා ගණයේ i ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ(05)ක අදාළ විෂයය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**02.** තනතුර : **සහකාර අධ්‍යක්ෂ (පාලන) (පුරප්පාඩු 01)**

**සේවා ගණය** : කළමනාකාර සේවා ගණය (MM 1 – 1)

**වැටුප් පරිමාණය** : MM 1 - 1 - 2025 රු:91,690 – 10 x 2,480 – 15 x 3,450 -168,240/=(මාසික)
(ක.සේ.ච.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:71,730 /=ක්ද, 2026.01.01 දිනට රු:81,710/=ක්ද සහ 2027.01.01 දින සිට රු:91,690/=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

**වයස** : අවු:22 ට නො අඩු හා අවු:45 ට නො වැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ උපාධියක් (කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය / වාණිජ්‍යය / ආර්ථික විද්‍යා විෂයයකින්) ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන(03)ක පළපුරුද්දක් ලබා තිබීම.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම හා අදාළ විෂයය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම.

**සහ**

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන(03)ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කණිෂ්ඨ කළමනාකාර (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ(05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන :** පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ දැනුම ලබා තිබිය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත තරග විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**03.** තනතුර : **සංරක්ෂණ නිලධාරී ii ශ්‍රේණිය (පුරප්පාඩු 01)**

**සේවා ගණය** : කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1 – 1)

**වැටුප් පරිමාණය** : JM 1 - 1 - 2025 රු:72,650 – 10 x 1,360 – 18 x 2,040 - 122,970/=(මාසික)
(ක.සේ.ච.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:58,615/=ක්ද, 2026.01.01 දිනට රු:65,633/=ක්ද සහ 2027.01.01 දින සිට රු:72,650/=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

**වයස** : අවු:22 ට නො අඩු හා අවු:45 ට නො වැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් (රසායන විද්‍යා විෂයය සහිතව) ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර (තාක්ෂණික) (MA 2 – 1) සේවා ගණයෙහි ලේඛන සංරක්ෂක / තොරතුරු සහකාර ii වන ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ(05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සටහන : පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ දැනුම ලබා තිබිය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත තරග විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**04.** තනතුර : **තොරතුරු සහකාර iii ශ්‍රේණිය (පුරප්පාඩු 10)**

**සේවා ගණය** : කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය (MA 2 – 1)

**වැටුප් පරිමාණය :** MA 2-1-2025 රු:50,540-10x540-07 x 630-04x890-20x1,190- 87,710/=(මාසික) (ක.සේ.ච.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:43,379/=ක්ද, 2026.01.01 දිනට රු:46,960/=ක්ද සහ 2027.01.01 දින සිට රු:50,540 /=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

**වයස** : අවු:18 ට නො අඩු හා අවු:35 ට නො වැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපන**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
- i. සිංහල / දෙමළ භාෂාව
- ii. ගණිතය
- iii. ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව එකවර විෂයයන් 06කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03)ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ මාස තුන(03)කට නො අඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම සහ මණ්ඩලය විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වීම.

**තාක්ෂණික නිපුනතා / ප්‍රවීණතා**

පිළිගත් විශ්වවිද්‍යාලයක / ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන්(03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු අදියර සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. (අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන (PL 1), අර්ධ ශිල්පීය (PL 2) හා ශිල්පීය(PL3) සේවා ගණයක වසර පහ(05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

   (ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
   - i. සිංහල / දෙමළ භාෂාව
   - ii. ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවතාවකට නො වැඩි වාර ගණනක දී විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

   (ඇ) පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ මාස තුන(03)කට නො අඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම සහ මණ්ඩලය විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වීම.

   (ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක / ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන් (03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු අදියර සමත්ව තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් ගෙන් සහ 30%ක් අභ්‍යන්තර අයදුම්කරුවන් ගෙන් ද වන අනුපාතයට බඳවා ගැනීම් සිදු කෙරේ.

05. **තනතුර** : කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය (පුරප්පාඩු 04)

**සේවා ගණය** : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය (MA 1 – 1)

**වැටුප් පරිමාණය** : MA 1-1-2025 රු:46,220-10x540-07x630-04x890-20x1,190- 83,390/= (මාසික)

(ක.සේ.ච.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:40,403/=ක්ද, 2026.01.01 දිනට රු:43,312 /=ක්ද සහ 2027.01.01 දින සිට රු:46,220/=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

**වයස** : අවු:18 ට නො අඩු හා අවු:45 ට නො වැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
- i. සිංහල / දෙමළ භාෂාව
- ii. ගණිතය
- iii. ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය(06)කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03)ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ මාස තුන(03)කට නො අඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම සහ මණ්ඩලය විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. (අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන (PL 1), අර්ධ ශිල්පීය (PL 2), ශිල්පීය(PL3) සේවා ගණයක වසර පහ(05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

   (ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී
   i. සිංහල / දෙමළ භාෂාව
   ii.ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

   (ඇ) පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ මාස තුන(03)කට නො අඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම සහ මණ්ඩලය විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වීම.

   (ඈ) සේවයේ ස්ථිර පත්වීම දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

   (ඉ) නියමිත දින පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**සටහන :**

යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත “ඉ’’ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික /අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත “ඉ’’ ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත තරග විභාගයක හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් ගෙන් සහ 30%ක් අභ්‍යන්තර අයදුම්කරුවන් ගෙන් ද වන අනුපාතයට බඳවා ගැනීම් සිදු කෙරේ.

**06.** **තනතුර** : **රියදුරු iii ශ්‍රේණිය (පුරප්පාඩු 03)**

**සේවා ගණය** : ශිල්පීය සේවා ගණය (PL 3)

**වැටුප් පරිමාණය** : PL 3 -2025 රු:43,280-10x490-10x540-10x590-12x630-67,040/= (මාසික)
(ක.සේ.ච.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:38,387/=ක්ද, 2026.01.01 දිනට රු:40,834/=ක්ද සහ 2027.01.01 දින සිට රු:43,280/=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

**වයස** : අවු:18 ට නො අඩු හා අවු:45 ට නො වැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නො වැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට (02) සම්මාන සහිතව විෂයයන් හය(06)කින් සමත්වීම.

**ප්‍රවීණතා :**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන(03)ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**සහ**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන(03)ක පළපුරුද්ද ලබා තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමය :** තනතුරට අදාළ පරිදි වූ වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

07. **තනතුර** : පොත් බැඳුම්කරු iii ශ්‍රේණිය (පුරප්පාඩු 02)

**සේවා ගණය** : ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (PL 2)

**වැටුප් පරිමාණය** : PL 2 -2025 රු:42,300-10x490-10x540-10x590-12x630- 66,060/= (මාසික)
(ක.සේ.ච.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:37,715/=ක්ද, 2026.01.01 දිනට රු:40,008 /=ක්ද සහ 2027.01.01 දින සිට රු:42,300/=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

**වයස** : අවු:18 ට නො අඩු හා අවු:45 ට නො වැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නො වැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙක(02)කට සම්මාන සහිතව විෂයයන් හය(06)කින් සමත් වී තිබීම.

**සහ**

තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළි ගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව ((NVQ) දෙවෙනි (02) මට්ටමට නො අඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ(05)ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්ය භාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක ((Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතාව ((NVQ) දෙවන (02) මට්ටමට නො අඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයේ සේවකයින්.

**බඳවා ගැනීමේ ක්‍රමය :** වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**08.** **තනතුර** : **කාර්යාල සහායක iii ශ්‍රේණිය (පුරප්පාඩු 10)**

**සේවා ගණය** : ශිල්පීය නොවන සේවා ගණය (PL 1)

**වැටුප් පරිමාණය :** PL 1 -2025 රු:40,500-10x450-10x490-07x540-15x590- 62,530/= (මාසික)

(ක.සේ.ච.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:36,475/=ක්ද, 2026.01.01 දිනට රු:38,488/=ක්ද සහ 2027.01.01 දින සිට රු:40,500/=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

**වයස** : අවු:18 ට නො අඩු හා අවු:45 ට නො වැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නො වැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙක(02)කට සම්මාන සහිතව විෂයයන් හය(06)කින් සමත් වී තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**සේවා කොන්දේසි :**

1. මෙම තනතුර ස්ථිර වන අතර, අවුරුදු තුන(03)ක පරිවාස කාලයකට යටත් වේ.
2. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් වැටුපෙන් 8%ක් ගෙවිය යුතු අතර, සේව්‍යයා විසින් 12%ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3%ක්ද ගෙවනු ලැබේ.

**ඉහත තනතුරු සඳහා රාජකාරි ස්ථානය - කොළඹ**

සම්පූර්ණ ජීව දත්ත තොරතුරු තම අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකු ගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකය ද ඇතුළත් කර අයදුම්පත අදාළ සහතික වල පිටපත් ද සමඟ "සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත - කොළඹ 07" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2025.10.03 දිනට හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය. අයදුම්පත් එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර තිබිය යුතුය.

රාජ්‍ය / අර්ධ රාජ්‍ය / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරනු ලබන අයදුම්කරුවන් ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තුව / ආයතන ප්‍රධානියා ගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වා ඇති සියලුම අවශ්‍යතා සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත - කොළඹ 07.
Website : www.natlib.lk